12

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 05/2012

මගේ අංකය: DAPH/AD/19/3/1
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.
2012.11.12

සියළුම අධ්‍යක්ෂවරුන් වෙත,

## මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන්ගේ නිල ඇඳුම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1989/02/23 දිනැති අංක 236 දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එහි උධෘතයන් පහත දක්වා ඇත.

"මාණ්ඩලික ශ්‍රේණිවලට අයත් සියළු රාජ්‍ය නිලධාරීන් සහ සංස්ථා නිලධාරීන් විසින් සිය කාර්යාලයට පැමිණීමේදී සහ / හෝ රාජකාරි කටයුතු සහ කාර්යයන් ඉටු කිරීමේදී ජාතික ඇඳුම හෝ කර වැසූ කබාය සමඟ කලිසමක් හෝ ටයි පටිය (tie) සහිතව කමිසය සහ කලිසමක් යන ඇඳුමින් සැරසී සිටිය යුතු යැයි රජය තීරණය කර ඇත.

කරුණාකර ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියා කරන්නේ නම් මැනවි. "

03. ඒ අනුව අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර පැවැත්වෙන සියළුම උත්සව අවස්ථාවලදී, රැස්වීම් වලදී හා වෙනත් දෙපාර්තමේන්තු උත්සව අවස්ථාවලදී ද එම චක්‍රලේඛයේ දැක්වෙන පරිදි මාණ්ඩලික නිලධාරීන් නියමිත නිල ඇඳුමින් සැරසී සිටිය යුතු බවත් කාරුණිකව දන්වමි.

04. එවැනි උත්සව අවස්ථාවලදී මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරිණියන් සාරියකින් හෝ ඔසරියකින් යුතු සුදුසු ඇඳුමකින් සැරසී සිටිය යුතු බව කාරුණිකව දන්වමි.

වෛද්‍ය ඩබ්. කේ. ද සිල්වා
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්